35

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2018 - 2 - 28 |

පැමිණිලිකාරිය : එම් .චම්පා මිය.
නො : 75/2. පන්සල්හේන පාර.
මීතොටමුල්ල. වැල්ලම්පිටිය.

වගඋත්තරකරුවන් :
01. ස්ථානාධිපති
පොලිස් ස්ථානය. වැල්ලම්පිටිය

02. උ.පො.ප මුදිත රුවන් මයා.
පොලිස් ස්ථානය. වැල්ලම්පිටිය.

03. පො.කො 77527 සුදේශ් මධුශංක මයා.
පොලිස් ස්ථානය. වැල්ලම්පිටිය.

04. පො.කො 59946 තිමල් මයා.
පොලිස් ස්ථානය. වැලිකඩ

05. පො.සැ 46235 ලාල් මයා
පොලිස් ස්ථානය. පාදුක්ක.

<u>පැමිණිලි අංක : HRC/60/13</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ. තමා සිට්වූ දමන අයෙක් බවත් කේ.ඩී.පැට්‍රික් යන අය තමා සමග සිට්වූ දැමූ බවත් සිට්වූ උඩ දැම්මේදි ඔහුට අවසන් සිට්වූ වාරය ලැබුනු අතර. දෙවන වාරයේ සිට්වුව අවසන් කිරිමෙන් පසුව එම තැනැත්තා සිට්වුවෙන් අයින් වන බව ප්‍රකාශ කරමින් ඔහු විසින් ලබාදි ඇති රුපියල්




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ක්ෂනික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.l
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

හයදහසක (රු.60000/-) මුදල නැවත ලබාදෙන ලෙස පැමිණිලිකාරියගෙන් ඉල්ලා සිටි බවත් පැමිණිලිකාරිය එය ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව එම තැනැත්තා විසින් වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් කර ඇති බවත්ය. එම පැමිණිල්ල වැල්ලම්පිටිය පොලිස් ස්ථානය විසින් විභාග කර විසඳුමකට පැමිණීමට නොහැකි වූ බැවින් සමථ මණ්ඩලය වෙත යොමු කිරීමට සිදුවූ බවත් සමථ මණ්ඩලයේදිද පැමිණිල්ල සම්බන්ධයෙන් සමථයකට පත් නොවූ බැවින් සිතාසියක් ලැබුනු පසු උසාවියට ඉදිරිපත් වන ලෙස සමථ මණ්ඩලයෙන් දැනුම් දෙන ලද බවත් දක්වා ඇත.

2013.01.03 වන දින වැල්ලම්පිටිය පොලිසියේ නිලධාරින් තිදෙනෙක් පැමිණ කටඋත්තරයකත් ලබා ගැනිමට අවශ්‍ය බැවින් පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස ස්ථානාධිපතිතුමා විසින් දැනුම් දුන් බවට පැමිණිලිකාරියට දැනුම් දි ඇති අතර ඒ අනුව පැමිණිලිකාරිය උදෑසන 10.00ට පොලිස් ස්ථානයට ඉදිරිපත් වූ බවද දක්වා ඇත.

පැමිණිලිකාරිය ස්ථානාධිපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු සුදර්ශන නැමැති නිලධාරියෙක් වෙත ස්ථානාධිපති විසින් භාර දෙන ලද බවත් තමාට විරුද්ධව වරෙන්තුවක් ඇති බැවින් එම වරෙන්තුව මත අත්අඩංගුවට ගැනිමට සිදුවන බවට තමා වෙත දැනුම් දි පොලිස් ස්ථානයේ ඇතුළත වාඩි වී සිටින ලෙසට ඇයට උපදෙස් දුන් බවද තමා තම දුරකථනයෙන් නිවසට දැනුම්දිමට සුදානම් උවද ඒ සඳහා අවස්ථාව ලබා නොදුන් බවත් එදින සවස 2.00 පමණ උසාවියට ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත නිදහස් කළ බවත් දන්වා පැමිණිල්ලෙන් දක්වා ඇත. තමන්ට විරුද්ධව වරෙන්තුවක් නොතිබූ බවත් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරිම මත තමාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරිය සිය පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති චෝදනාව වන්නේ 2012.10.10 වන දින අධිකරණය විසින් නිකුත් කර ඇත්තේ පැමිණිලිකාරියට සිතාසියක් බවත් නමුත් විනිශ්චයකාරතුමාගේ නියෝගයකින් තොරව අත්අඩංගුවට ගැනිම හා පැමිණිලිකාරියව පොලිස් ස්ථානයට ගෙන්වා ගෙන ඇත්තේ අදාළ චෝදනාව සම්බන්ධයෙන් පූර්ව දැනුම්දිමකින් තොරව බවත් පොලිසිය තුළදි පොලිස් නිලධාරින් විසින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයට වාචිකව අපහාස වන අන්දමින් කටයුතු කිරිම මගින් පොලිස් ස්ථානය තුළදි අවමන් සහගත සැලකිල්ලකට ලක්වූ කරන ලද බවයි.

පැමිණිල්ලේ සාක්ෂි :-

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් මීතොටමුල්ල පන්සල පාර. නො : 59/බී පදිංචි ලොකු දඩල්ලගේ චමිලා දිශානි යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ. 2013.01.03 වන දින පැමිණිලිකාරියට පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දැනුම්දුන් බවත් ඇය විසින් පොලිසියට යාමට පෙර ඒ බව .තමා වෙත දැනුම්දුන් බවත් නමුත් පොලිසියට ගොස් ඇය පැය කිහිපයකින් නොපැමිණි

නිසා ඇය විසින් පැමිණිලිකාරියගේ දුරකථනයට ඇමතුම් කිහිපයක් ලබාදුන් බවත් ඇය හට පැමිණිලිකාරිය සම්බන්ධ කර ගැනිමට නොහැකි වූ බවත් ප්‍රකාශ කර ඇත. එම නිසා තමා වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ගිය අතර ඇය පොලිස් ස්ථානයේ පුටුවක වාඩිවී සිටි බවද ඇය සමග කතා කිරිමට තමාට අවස්ථාවක් නොදුන් බවද සදහන් කර ඇත. නමුත් ඇය ඉතා අපහසුවෙන් පැමිණිලිකාරිය වෙත ගොස් ඇගේ බෑගය සහ දුරකථනය ලබාගත් බවත් එම දුරකථනයෙන් පැමිණිලිකාරියාගේ පුතාට මේ බව දැනුම්දුන් බව සදහන් කර ඇත.

එසේම පැමිණිලිකාරියව අධිකරණයට රැගෙන ගියේ පිරිමි සැකකරුවන් සමග බවත් අධිකරණයට රැගෙන යන අවස්ථාවේ කාන්තා නිලධාරියෙක් එම රථයේ නොසිටි බව සදහන් කර ඇත. ඉන් පසුව 15434/02/12 දරණ නඩුව සම්බන්ධයෙන් පැමිණිලිකාරියට ඇප ලැබුනු බවද පැමිණිලකාරිය පොලිස් ස්ථානය තුළ විශාල පීඩනයකට ලක්වී සිටි බවට ඇය පොලිසිය තුළ සිටි ආකාරයෙන් තමාට වැටහි ගිය බව දිවුරුම් ප්‍රකාශයේ සදහන් කර ඇත.

නො : 75/2, මීතොටමුල්ල, පාන්සල පාර පදිංචි කාරියවසම් පතිරණගේ ශානක අනුපම යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ 2013.01.03 වන දින තමා රැකියාව කරමින් සිටියදි දඩල්ලගේ චමිලා දිශානි යන අය තමාට දුරකථන ඇමතුමක් ලබාගත් බවත් තමාගේ මව වන මුහුම්දිරම්ගේ චම්පා යන අය වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ අත්අඩංගුවේ සිටින බවට දැනුම් දුන් බවයි. තමා හැකි ඉක්මනින් වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට පැමිණි බවත් තමා මව අත්අඩංගුවට ගැනිමට හේතුව විමසුවද ඒ සම්බන්ධයෙන් නිසි පිළිතුරක් නොලැබුනු බව සදහන් කරයි. පසුව තමා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණි අතර තමාගේ මව අනෙකුත් පිරිමි සැකකරුවන් සමග පොලිස් ජිප් රථයෙන් උසාවියට නංවාගෙන පැමිණි බවත්, එම ජිප් රථය තුළ කිසිදු කාන්තා පොලිස් නිලධාරිනියක් නොසිටි බව සදහන් කර ඇත. දිවුරුම් ප්‍රකාශයේ තවදුරටත් සදහන් වන්නේ තමාගේ මව කතා කරගත නොහැකි ලෙස ඉතා අසරණව සිටි බවයි. ඇය පොලිසිය තුළදි අවමන් සහගත සැලකිල්ලකට ලක්වී ඇති බව බැලූ බැල්මට පෙනි යන බවයි.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තර පාර්ශවය සදහන් කර ඇත්තේ මෙම පැමිණිලිකාරිය මුදල් ආරවුලක් මත කොළඹ මසේත්‍රාත් අධිකරණයේ නඩු අංක : 1534/02/12 යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් මත පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දැන්විමෙන් පසු 2013.01.03 වන දින අත්අඩංගුවට ගන්නා ලද බවයි. අත්අඩංගුවට ගැනිම සම්බන්ධයෙන් තොරතුරු සටහන් පොත්වල උධෘත ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුවන් විසින් සිරභාරයට ගැනිමේ වරෙන්තුවේ පිටපතක්ද, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 154343/02/12 දරණ නඩුවේ නඩු වාර්තාවේ පිටපතක් හා සමථ මණ්ඩලය විසින් සමථ නොවිමේ වාර්තාවේ පිටපතක්ද ඉදිරිපත් කර ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැති 1534/02/12 දරණ නඩුව යටතේ ගරු මහේස්ත්‍රාත්වරයා විසින් වරෙන්තුවක් නිකුත් කර ඇත. එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එසේ හෙයින් සිරභාරයට ගැනීම නීති විරෝධී යැයි කිව නොහැක.

පැමිණිලිකාරියට විරුද්ධව මුදල් ආරවුලක් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් තිබී ඇති අතර පොලීසිය විසින් එය සමථ මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු සමථ නොවීමේ වාර්තාව අධිකරණයට ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකාරියට විරුද්ධව පැවැති නඩුවේදී පැමිණිලිකාරිය විසින් රුපියල් හැටදායක (60000/-) මුදලක් අනෙක් පාර්ශවයන්ට ගෙවා ඇති අතර. පාර්ශවයන්ට අවවාද කර මුදාහැර ඇති බවද නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්.

පොලීසිය තුළදී අවමන් සහගත සැලකිල්ලකට ලක්කර ඇති බවට පැමිණිලිකාරිය විසින් වගඋත්තරකරුවන් වෙත චෝදනා ඉදිරිපත් කළද එය සාක්ෂි මගින් තහවුරු කිරීමට අපොහොසත් වී ඇති බවද නිරීක්ෂණය වේ. තවද පැමිණිලිකාරියව අධිකරණයට රැගෙන එන අවස්ථාව සඳහා කිසිදු කාන්තා නිලධාරිනියක් හෝ පාලිකාවක් නොසිටි බවත් ඇයව රැගෙන ගොස් ඇත්තේ අනෙකුත් පිරිමි සැකකරුවන් සමග බවත් ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව තහවුරු වී ඇත.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක ඒ 20 දරණ දෙපාර්තමේන්තු නියෝගවල පොලිස් ආරක්ෂාව භාරයේ සිටින තැනැත්තන් පිළිබඳව නීතිරීති යටතේ පොලීසිය සතු යුතුකම් හා අත්අඩංගුවේ සිටින අයගේ අයිතිවාසිකම් යටතේ එහි 08 වෙනි රීතිය වන 'සිරභාරයේ සිටින තැනැත්තන් භාරවයාම' යටතේ ජේ කොටසේ 'ස්ත්‍රියක් ආරක්ෂාව යටතේ ගෙන යන විට නැයෙක් හෝ විශ්වාස කටයුතු පාලිකාවක් එම තැනැත්තිය කැටුව හා යුතුය.' යන්න දක්වා ඇත.

නිගමනය :-

ඉහත කරුණු අනුව එකී කඩකිරීම මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් හිමිකර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සිදුකර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලබයි.

නිර්දේශය :-

01. ස්ත්‍රියක් අත්අඩංගුවට ගන්නා සහ රඳවා ගන්නා අවස්ථාවේදී ඇයව ආරක්ෂාව යටතේ රැගෙන යාමේදී කාන්තා නිලධාරිනියක් හෝ පාලිකාවක් යටතේ ආරක්ෂිතව රැගෙන යා යුතු බවට වන දෙපාර්තමේන්තු නියෝග ඒ ආකාරයෙන්ම පිළිපදින ලෙසට දිවයිනේ සිටින සියළු පොලිස් නිලධාරීන් හට අභ්‍යන්තර චක්‍රලේඛ මගින් දැනුම් දෙන ලෙසට පොලිස්පතිවරයා වෙත දැනුම් දෙනු ලැබේ.

02. 01. 02. 03. 04 සහ 05 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරිය වෙත රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

03. මෙහි පිටපත් අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙත සහ ජාතික පොලිස් කොමිසම වෙත යොමු කරනු ලැබේ.

2018.06.01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/